# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2294/48 - 2022 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2022.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(අ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1)(අ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2007 පෙබරවාරි මස 02 වැනි දින අංක 1482/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ශාස්ත්‍ර පීඨය" යන අයිතමයට (2017 අප්‍රේල් මස 19 වැනි දින අංක 2015/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) අනුරූපව උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "18. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය" යන සටහනට (2020 සැප්තැම්බර් මස 11 වැනි දින අංක 2192/63 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීම මගින් :-

"19. තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය" ; සහ

(2) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "දන්ත වෛද්‍ය පීඨය" යන අයිතමයට අනුරූපව II වන තීරයේ දැක්වෙන "7. දන්ත සංරක්ෂණ අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් :-

"8. පරිපූර්ණ මුඛ සෞඛ්‍ය සත්කාර අධ්‍යයන අංශය." .

**ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0242

1A - PG 5941 — 457 (2022/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*